# යාකොබ් 3

– 11st Story–




74Page

**පොතේ ගුරා** අවුරුදු 20 කට පසුව යාකොබ්ට තමන්ගේ මවු දේශයට යන්න ලොකු ආශාවක් තිබුණා. එක දවසක් යාකොබ් තමන්ගේ දේපළ ඇතුලුව අන් සියල්ලම රැගෙන මව් දේශයට යන්න පිටත් වුණා.
එහෙත් තමන්ගේ වැඩිමහල් සහෝදර ඒසව්ට බයක් තිබූ නිසා නිවසට ළං වෙද්දිම යාකොබ් බොහෝ කනස්සලු වෙන්න පටන් ගත්තා.

**යාකොබ්** ඒසව් මට තවමත් වෛර කරනවානම් ?

.......................................................................................




75Page

**පොතේ ගුරා** යාකොබ් තමාගේ මෙහෙකරුවන් පළමුව පෙරටුව යැව්වා.
මේ මෙහෙකරුවන් ගොස් හැරී ඇවිත් මෙහෙම කිව්වා.

**මෙහෙකරුවන්** ස්වාමිනි, ඔබගේ සහෝදරයාට මිනිසුන් 400ක් ඉන්නවා.
ඒ 400 යි ඔබේ සහෝදරයයි දැන් ඔබව හමුවෙන්නට එනවා.

**පොතේ ගුරා** යාකොබ් මේ දේ ඇහුවාම හොඳටම බය වුණා.
මන්ද සහෝදරයා එන්නේ තමන් පෙර කරපු වරදට දඬුවම් කරන්න යැයි කියා යාකොබ් සිතුවා.

.......................................................................................



76Page

**පොතේ ගුරා** මේ නිසා යාකොබ් තමන්ගේ පවුලේ අවට පෙරටුවෙන්ම යවන්න තීරණය කළා. ඒසව්ට වටිනා ත්‍යාගයක් සූදානම් කරන ලෙස තමුන්ගේ මෙහෙකරුවන්ට කීවා. මෙසේ සැලසුම් කළ යාකොබ් තමාට තිබූ මරණ බය නිසා පිටු පසින්ම යාමට තීරණය කළා.

.......................................................................................




77Page

**පොතේ ගුරා** එදා රාත්‍රියේ දී දුක හා කනස්සල්ල පැවතීම හේතුවෙන් යාකොබ්ට නින්ද ගියේ නෑ. මේ වෙලාවේ හදිසියෙන්ම යම් කෙනෙක් ඔහු ඉදිරියේ මතු වුණා. ඒ දෙවියන්වහන්සේගේ දූතයෙක්. මේ දේවදූතයා මුළු රාත්‍රිය පුරාම යාකොබ් සමග පොරබැදුවා. මේ පොරබැදීමේ දී ජය ලබන පිණිස යාකොබ් තමාගේ මුළු ශක්තියම යෙදුවා.
ඉර උදාවීගෙන එත්ම දේවදූතයා යාකොබ්ට කතා කොට මෙසේ කිව්වා.

**දේවදූතයා** දැන් ඔබගේ නාමය ඉශ්රායෙල්.

.......................................................................................



78Page

**පොතේ ගුරා** දේවදූතයා පිටත් වී ගියා. මේ සිදුවීමෙන් පසු යාකොබ් තමන්ගේ සහෝදර ඒසව් හමුවීමට ගියා. එවිට ඒසව් දුවගෙන ඇවිත් යාකොබ් සිප වැළඳගෙන අඬන්න පටන් ගත්තා.

**ඒසව්** මේ නිසා යාකොබ්ට තවදුරටත් කනස්සලු වෙන්නට කිසිවක් තිබුණේ නෑ.
අනේ මගේ කුඩා සහෝදරයා. මං ඔයා නැතිව ගොඩාක් පාළුවෙන් හිටියේ.

| | |
|---|---|
| පොතේ ගුරා | මෙසෝ අයියත් මල්ලීත් සිප වැළඳගෙන ඇඬුවා.<br>දෙවියන්වහන්සේගේ ආශිර්වාද සහ දෙමාපිය ආශිර්වාදය යාකොබ්ට තිබුණු නිසා ඔහු බොහෝ ධනවත් වී සිටියා.<br>අන්තිමට යාකොබ් තමන්ගේ මව් දේශයට මේ ආකාරයෙන් පැමිණුනා.<br>..................................................................................... |
| ජිවිතයට අදාල කිරීම | දුවේ පුතේ, රැවටිලිකාරයන්ටත් දෙවියන්වහන්සේ ආදරෙයි.<br>ඒ අය පසුතැවිලි වුණොත් උන්වහන්සේ ඒ අයටත් නැවතත් ජීවිතය හදාගන්න උදව් කරනවා. දෙවියන්වහන්සේ වරදට අකමැති නමුත් වැරැදිකරුවන්ට ප්‍රේම කරන්නේය. |